# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No – 10120

ෆැක්ස්
தொலைநகல
Fax – 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site – www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail – dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO – 1522/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No – / 2024

දිනය
திக
Date – 28/09/2024 පැය 1220

# මාධ්‍ය නිවේදනය

## 01. නිවසක් ගිණිගෙන පුද්ගලයෙකු මිය යාමක් - කොස්වත්ත පොලිස් වසම.

2024.09.28 වන අද දින අළුයම් කාලයේ හලාවත කොස්වත්ත පොලිස් වසමේ තුම්මෝදර, නාත්තන්ඩිය ලිපිනයේ පිහිටි නිවසක ඇති වූ ගින්නක් හේතුවෙන් පුද්ගලයෙක් පිළිස්සී මිය ගොස් ඇති බවට කොස්වත්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ තුම්මෝදර, නාත්තන්ඩිය ප්‍රදේශයේ පදිංචි අවිවාහක පුද්ගලයෙකි.**

මරණකරු ඉදිකරමින් පවතින තම නිවසේ කාමරයක් තුල තනිව පදිංචිව සිට ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘතශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. කොස්වත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2024.09.28 වන අද දින අළුයම් කාලයේ වාරියපොල හලාවත මාර්ගයේ කිරිවනාගාරය ප්‍රදේශයේදී වාරියපොල දෙස සිට හලාවත දෙසට ධාවනය වූ කැබ් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ විරුද්ධ දෙසින් පැමිණි ත්‍රීරෝද රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු හා මඟීන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා වාරියපොල රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ ඉහළ උඩගම, උලපනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාලකරුවන් දෙදෙනා වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කර ඇත. මෘත ශරීරය වාරියපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - අඹිලිපිටිය පොලිස් වසම.

2024.09.27 වන දින සවස් කාලයේ ඇඹිලිපිටිය පොලිස් වසමේ රත්නපුර ඇඹිලිපිටිය මාර්ගයේ 97 වන කිලෝමීටර් කණුව ආසන්නයේ රත්නපුර දෙස සිට අඹිලිපිටිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත.

**මරණකාරියගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර ප්‍රදේශයේ සැරිසරන යාචක කාන්තාවක් බවට අනාවරණය වී ඇත.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරෙන් පසු යතුරුපැදිකරු එම ස්ථානයෙන් පලා ගොස් ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඇඹිලිපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**